1979 -2- 14

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 8 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 8 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 15/78.

ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කිරීම පිණිස ද ප්‍රමාණවත් සාධාරණත්වයක් නොමැතිව යම් තැනැත්තන්ගේ ඉඩම් අත්කර ගෙන තිබේ ද ඒ තැනැත්තන්ට සහනය සැලසීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:— ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 8 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

39අ වන අලුත් වගන්තිය 460 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.

2. 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39අ වන වගන්තිය ලෙස ක්‍රියාත්මක විය යුතු ය:—

'නියම සන්තකය ලබා ගෙන ඇති අවස්ථාවල. එම ඉඩම අවසතු කිරීම.

39අ. (1) (මෙහි මින් මතු මේ වගන්තියෙහි "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) 38 වන වගන්තිය යටතේ නියමයක ප්‍රකාර යම් ඉඩමක් රජය සතු කරනු ලැබ, 40 වන වගන්තියේ (අ) ඡේදයෙහි විධිවිධාන යටතේ ඒ ඉඩමෙහි නියම සන්තකය රජය සඳහා හෝ වෙනුවෙන් භාර ගෙන තිබුණ ද ඒ නොතකා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු මේ වගන්තියෙහි "අවසතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) තදනන්තර නියමයක් මගින් පෙර කී සතු කිරීමේ නියමයෙන් එසේ සතු කර ගන්නා ලද ඉඩම, (2) වන උපවගන්තියට යටත්ව රජයෙන් අවසතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවසතු කිරීමේ නියමයක් කිරීමට පෙර අමාත්‍යවරයා—

(අ) එකී අවසතු කිරීමේ නියමය කිරීමට අදහස් කරන්නේ යම් ඉඩමකට අදාළව ද, ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට මේ පනත යටතේ වන්දි කිසිවක් ගෙවා නැති බවට;

(ආ) 40 වන වගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ රජය විසින් එම ඉඩමෙහි සන්තකය භාර ගනු ලැබීමෙන් පසුව එකී ඉඩම පොදු කාර්යයක් සඳහා පාවිච්චි කර නැති බවට;

(ඈ) 40 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සන්තකය සඳහා නියමය කරනු ලැබීමෙන් පසුව, එකී ඉඩම සම්බන්ධයෙන් වැඩි දියුණු කිරීම් කර නොමැති බවට; සහ

(ඇ) අවසතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු එකී ඉඩමෙහි සන්තකය වහාම භාර ගැනීමට එම ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තා හෝ තැනැත්තන් ලියවිල්ලකින් එකඟ වී ඇති බවට

සෑහීමට පත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අවසතු කිරීමේ නියමයක පිටපත්, එම නියමය අදාළ වන ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි ප්‍රචලිත, යටත් පිරිසෙයින් එක් සිංහල දිනපතා පුවත් පතක, එක් දෙමළ දිනපතා පුවත් පතක සහ එක් ඉංග්‍රීසි දිනපතා පුවත් පතක පළ කරනු ලැබිය යුතු අතර, එම ඉඩමෙහි සහ එම ඉඩම ආසන්න ප්‍රදේශයේ ප්‍රකටව පෙනෙන ස්ථානවල ඒ පිටපත් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් සතු කිරීමේ නියමයක් මගින් රජය සතු කර ගනු ලැබූ යම් ඉඩමක්, එකී උපවගන්තිය යටතේ අවසතු කිරීමේ නියමයක් මගින් තදනන්තරව අවසතු කරනු ලැබූ යම් අවස්ථාවක පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) ඒ සතු කිරීමේ නියමයෙහි ප්‍රකාර, එම ඉඩම කිසිම අවස්ථාවක රජය සතු නො වූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති තැනැත්තකුගේ ඒ ඉඩම කෙරෙහි හෝ ඒ ඉඩම සම්බන්ධයෙන් පැවති, සෑම අයිතියක් ම, හිමිකමක් ම හෝ සම්බන්ධතාවක් ම අහෝසි නොවී පැවති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සතු කිරීමේ නියමය නොතකා ඒ සෑම අයිතියක් ම, හිමිකමක් ම සහ සම්බන්ධතාවක් ම වලංගු සහ බලාන්විත විය යුතු ය;

(ඈ) සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවේ දී ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් දරූ තැනැත්තාට හෝ තැනැත්තන්ට එකී ඉඩමෙහි සන්තකය වහාම නැවත ලබා දිය යුතු ය;

(ඈ) අවසතු කිරීමේ නියමය ක්‍රියාත්මක වීමට පෙර, ඒ ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය සම්බන්ධයෙන් මේ පනත යටතේ කරන ලද සියලු හිමිකම් පෑම් ද, එකී හිමිකම් පෑමට අදාළව මේ පනත යටතේ කරන ලද සියලු කටයුතු ද අවලංගු සහ බල රහිත ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) සතු කිරීමේ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අවස්ථාවෙහි හෝ ඉන් ඉක්බිතිව හෝ ඒ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් දරමින් සිටි යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කරනු ලබන ඒ ඉඩම සම්බන්ධයෙන් වන්දි සඳහා කිසිදු අලුත් හිමිකම් පෑමක් හෝ රජයට, රජයේ නිලධරයකුට නැත හොත් අමාත්‍යවරයාට විරුද්ධව අලාභ සඳහා කිසිදු හිමිකම් පෑමක් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් භාර ගැනීම හෝ එබඳු හිමිකම් පෑමකට ඉඩ දීම හෝ නොකළ යුතු ය; තව ද

(ඊ) මේ පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතු ය.'.